## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2015

-----------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

-------------------------------------

ප්‍රමිතයේ ඡේද අංක 32 අනුව අවශ්‍ය විටක හෝ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මගින් අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කළ නොහැකි බව දක්වා තිබුණද, නියැදි පරීක්ෂාවට අනුව උපකොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ගිණුමෙහි හර ශේෂ සහ බැර ශේෂ එකිනෙකට හිලව් කිරීම හේතුවෙන් ණයහිමි බැර ශේෂය රු.110,764,584 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

------------------------------------

ප්‍රමිතය අනුව තොග අගය කිරීමේදී, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන අගයන්ගෙන් අඩු අගයට තොග අගය කළ යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනට තොග ගණනය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගයෙන් (NRV) සියයට 92.5 ක් පිරිවැය ලෙස සලකා නිමි තොග අගය කිරීම සිදු කර තිබුණි. ඒ අනුව, නිවැරදි පිරිවැය හඳුනාගැනීමකින් තොරව තොග අගය කිරීම හේතුවෙන් තොග ඌන හෝ අධිගණනය විය හැකි බව නිරීක්ෂණය විය.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

-------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.68,197,875 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ, ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිශ්චිතව හඳුනාගත හැකි බැඳීම් වෙනුවෙන් අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීමක් සිදු කළ යුතු වුවද , සංස්ථාවට එරෙහිව පවරා තිබූ නඩු 02 කට අදාළව නිශ්චිතව හඳුනාගෙන තිබූ රු.16,234,441 ක බැඳීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) 2014 සහ 2015 වර්ෂවලට අදාළව නොගෙවූ එකතුකළ අගය මත බද්දට අදාළ රු.121,782,475 ක දඩ මුදල් හා 2013 වර්ෂයට අදාළ රු.6,941,026 ක දඩ මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(iii) පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වීම මත ගෙවිය යුතු රු.3,008,204 ක දඩ මුදල් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ඌනගණනය වී තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට හත්වන මහලේ උතුරු කොටස ලංකා සිමෙන්ති සංස්ථාවට කුලියට දීමෙන් ලැබිය යුතු මුළු ආදායම රු.8,461,726 ක් වුවද එය රු.9,172,403 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් හා වර්ෂයේ අලාභය රු.710,677 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා සිමෙන්ති සමාගමට හත්වන මහලේ දකුණු කොටස කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් 2014 වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා බදු කුලී ආදායම පිළිවෙලින් රු.2,130,566 කින් හා රු.2,934,180 කින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් එම වර්ෂයන්හි අලාභය වැඩියෙන් හා ලැබිය යුතු වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී සිදුකළ වැඩ සම්බන්ධයෙන් ව්‍යාපෘති 06 කට අදාළව එකතුව රු.996,342 ක ශුද්ධ ලාභය අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබීම හේතුවෙන් වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ඌනගණනය වී තිබුණි.

(ඈ) 2014 වර්ෂයට අදාළව හඳුනාගත් අමතර වැඩ (Extra Works) 2015 වර්ෂය සඳහා ඉදිරියට ගෙන නොතිබීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ අලාභය රු.2,119,798 කින් අධිගණනය වී තිබුණි.

(ඉ) ඉදිකිරීම් අංශයට අයත් වැඩබිම් 07 ක හා යන්ත්‍රෝපකරණ හා උපාංග (E&M) අංශයට අයත් එක් වැඩබිමක වර්ෂ කිහිපයක සිට පැවත එන කොන්ත්‍රාත්වලට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.11,030,827 ක පිරිවැයක් පෙන්නුම් කළ ද, එයට අදාළ රු.1,355,242 ක ලාභය හඳුනාගෙන නොතිබීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඊ) කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා පිරිවැය දරා තිබූ වැඩබිම් 03 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ගැලපුම් කරන ලද ආදායම (Adjusted Income) හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව සමුච්චිත පිරිවැය රු.8,366,810 ක් අලාභයක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් වසරේ අලාභය රු.389,529 කින් අධිගණනය වී තිබුණි.

(උ) අංගොඩ නිවාස ව්‍යාපෘතියට අයත් අවසන් තොග අයිතම 2ක් ද්වි ගණනයවීම හේතුවෙන් අවසන් තොගය රු.396,206 කින් අධිගණනය වී තිබුණි.

(ඌ) රත්මලාන ගබඩාවේ පැවති ලී තොග අයිතම 18 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) වැඩබිම් අංක 1099, 237 හා 343 හි 2014 වර්ෂයේ සෙමින් චලනය වන තොගයේ ඇතුළත් N (වර්ෂයට අඩු) ලෙස වර්ගීකරණය කර ඇති අයිතම 2015 වර්ෂයේද එසේම පැවති අතර එම තොග N1 (වර්ෂයට වැඩි) ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. මෙම සෙමින් චලනය වන තොගයෙහි වටිනාකම රු.11,451,602 ක් වූයෙන් ඒ මත සියයට 15 ක ප්‍රතිපාදන වෙන්කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබීම හේතුවෙන් තොග වටිනාකම රු.1,717,740 කින් අධිගණනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ඒ) විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂණයට අනුව, වැඩබිම් අංක 343 හා 237 යන ස්ථානවල නිමි තොග අගය කිරීමේදී වසරකට වැඩි කාලයක් (N1) සහ වසර 2 කට වැඩි කාලයක් (N2) පැවති අයිතමවල 2015 වර්ෂයේ සත්‍යාපන වටිනාකම 2014 වර්ෂයේ වටිනාකමට වඩා රු.677,338 කින් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අලාභය එම වටිනාකමින් අඩුවෙන් සහ වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) වැඩබිම් අනුව, ඉදිරිපත් කරන ලද රු.3,967,410,436 ක වටිනාකමකින් යුත් පිරිවැය ලේඛනයෙහි රු.1,433,820 ක වටිනාකමකින් යුත් බැර ශේෂ නිරීක්ෂණය වූ අතර, විකුණුම් පිරිවැය එම වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි.

(ඕ) ණයගැති අපහායනය සඳහා වෙන් කිරීම් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී ණයගැති ශේෂ නොමැති හා සත්‍ය ණයගැති ශේෂය ඉක්මවා රු.74,584,331 ක වෙන්කිරීම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ක) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය ප්‍රකාරව සංස්ථාවට පවරා තිබූ අක්කර 13 රූඩ් 03 පර්චස් 35 ක් වූ ඒකල පිහිටි ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොග සමීක්ෂණ වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 දිනට භෞතික තොග ශේෂ බින් කාඩ්පත් ශේෂ සමග සැසඳීමේදී බින් කාඩ්පත් 149 කට අදාළ තොග අයිතමයන්ගේ වටිනාකම් අතර රු.5,297,373ක ඌනතාවයක් හා බින් කාඩ්පත් 57 කට අදාළව රු.3,243,713ක අතිරික්තයක් පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව රු.19,903,480 ක් වුවත් උපලේඛනය අනුව එම ශේෂය රු.6,767,360 ක් වූයෙන් රු.13,136,120 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශයේ (E&M) සේජ් පරිගණක මෘදුකාංගයේ 2015 දෙසැම්බර් 31 දිනට අපහායනය සඳහා වෙන් කිරීම් ගිණුමේ ශේෂය රු.117,697,607 ක් වුවද, ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව එම ශේෂය රු.117,687,606 ක් වූයෙන් රු.10,001 ක වෙනසක් විය.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට කේවල ණයගැති ශේෂයන් සම්බන්ධ සටහන් නිවැරදි ලෙස හඳුනා නොගැනීමෙන් ණයගැති ශේෂ තුළ රු.106,981,333 ක අසාමාන්‍ය බැර ශේෂයන් ඇති වී තිබුණි.

(ඉ) යන්ත්‍රෝපකරණ හා උපාංග අංශයේ ඉදිරිපත් කළ උපලේඛන අනුව, ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු වටිනාකම් රු. 173,856,115 ක් වූ අතර අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. 197,876,934 ක් වූයෙන් රු. 24,020,819 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ඉදිකිරීම් උපාංග අංශයට හා යාන්ත්‍රික, විදුලි හා යන්ත්‍රෝපකරණ අංශයට (M & E) අයත් වැඩබිම් 02 ක සමාලෝචිත වර්ෂයට අදාළ පිරිවැය රු.223,839 ක සෘණ අගයක් පෙන්නුම් කළ අතර මෙම අසාමාන්‍ය ශේෂය ඇතිවූ ආකාරය පැහැදිලි කර නොතිබුණි.

(උ) ණයගැති ශේෂ සනාථ කිරීම් පිළිබඳ සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී ආයතන 05 කින් ලද තොරතුරු මත සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද ණයගැති ශේෂය හා ඒ ඒ ආයතනවලින් ඉදිරිපත් කරන ලද ණයගැති ශේෂ අතර රු.283,475,081 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතනයේ නම | සංස්ථාවේ ශේෂය | ණයගැති ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| භික්ෂු විශ්ව විද්‍යාලය | 35,899,936 | 47,957,674 | 12,057,738 |
| නාගරික සංවර්ධන අධිකාරිය | 165,502,006 | 62,641,518 | 102,860,488 |
| රජරට විශ්ව විද්‍යාලය | 186,960,033 | 49,392,149 | 137,567,884 |
| රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 6,866,665 | 4,838,593 | 2,028,072 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 66,806,000 | 37,845,101 | 28,960,899 |
| එකතුව | | | 283,475,081 |

## 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) බැංකු ජංගම ගිණුම් - 02 | 213,835 | ශේෂ සනාථ කිරීම් |
| (ආ) ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ හා සේවා යන අංශයන්ට අයත් බැංකු ගිණුම | 18,693,422 | 2015 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශන |
| (ඇ) අක්‍රීය බැංකු ගිණුම - නේපාලය | 1,880,176 | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ, බැංකු සැසඳුම් |
| (ඈ) සේවා අංශයේ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු වටිනාකම් | 543,895,470 | විස්තරාත්මක උපලේඛන |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හත්වන මහලේ දකුණු කොටස සිමෙන්ති සමාගමට කුලියට දීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හත්වන මහලේ දකුණු කොටස, 2007 ජනවාරි 01 දින සිට 2008 දෙසැම්බර් 31 දක්වා වසර 02 ක කාල පරිච්ඡේදයකට බදු දීම සඳහා 2007 මාර්තු 08 දින සිමෙන්ති සමාගම සමග බදු ගිවිසුමකට එළඹ තිබුණද, එම කාලය ඉක්මවා 2015 ජුනි මාසය දක්වා භාවිතා කර තිබුණි. ඒ සඳහා හිඟ හිටි කුලී වටිනාකම රු.20,362,650 ක් හා ඊට අමතරව රු.3,458,495 ක විදුලි හා ජල ගාස්තුවක්ද අයවිය යුතුව තිබුණද මෙම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ලංකා සිමෙන්ති සමාගම සමග ඇතිකර ගෙන තිබූ බදු ගිවිසුමෙහි සඳහන් ඉඩ ප්‍රමාණය වර්ග අඩි 2,976 ක් වුවද, එම සමාගම විසින් සත්‍ය ලෙස පරිහරණය කරන ලද ඉඩ ප්‍රමාණය වර්ග අඩි 3,175 ක් විය. ඒ අනුව අතිරේකව භාවිතා කරන ලද වර්ග අඩි 199 වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2015 ජුනි 30 දක්වා රු.1,596,878 ක ආදායමක් අයවිය යුතුව තිබුණි.

(iii) 2006 දෙසැම්බර් 31 දිනට පෙර සිට පැවත එන හිඟ ජල හා විදුලි ගාස්තු සඳහා රු.690,610 ක මුදලක් මේ දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හත්වන මහලේ උතුරු කොටස ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට කුලියට දීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ හත්වෙනි මහලෙහි උතුරු කොටස 2007 ජනවාරි 01 සිට 2009 දෙසැම්බර් 31 දක්වා වසර 03 ක කාලපරිච්ඡේදයකට බදු දීම සඳහා ගිවිසුම්ගත වී තිබුණද ගිවිසුම් කාලය ඉක්මවා 2012 දෙසැම්බර් 31 දින දක්වා භාවිතා කර තිබුණි. ඒ වෙනුවෙන් අයවිය යුතු රු.7,609,925 ක් විගණිත දිනය වූ 2016 ජනවාරි 08 දක්වා අයකර ගෙන නොතිබුණි.

(ii) ගිවිසුම්ගත වර්ග අඩි ප්‍රමාණය 2,222.37 ක් වුවද ලංකා සිමෙන්ති සමාගම වර්ග අඩි 2,365 ක භූමි ප්‍රමාණයක් පරිහරණය කොට ඇති අතර ඒ අනුව අතිරේකව භාවිතා කරන ලද වර්ග අඩි 142.63 ක ප්‍රමාණය වෙනුවෙන් 2007 වසරේ සිට 2012 දෙසැම්බර් දක්වා රු.756,722 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශේෂ මුදල් අත්තිකාරම් රු.5,649,349 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඉන් රු.5,163,834 ක ශේෂයක් වර්ෂ 03 කට අධික කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණය අනුව වසර 3 ත් වසර 5 ත් අතර ණය හිමි ශේෂය රු.15,589,164 ක් සහ වසර 5 ඉක්මවූ ණය හිමි ශේෂය රු.348,682,368 ක් වුවත් එම ශේෂ නිරවුල් කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,455,828,381 ක් වූ වෙළඳ ණය ගැති ශේෂයෙන් සියයට 95කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතුව තිබූ අතර, ඉන් රු.1,074,632,091 ක් හෙවත් මුළු වටිනාකමින් සියයට 33 ක් වර්ෂ 05 කට වඩා කල් ඉකුත් වූ ණය ශේෂයන් විය. මෙම මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ණයගැතියන් ලෙස නිශ්චිතව හඳුනා නොගත් රු.7,444,055 ක් විවිධ ණයගැතියන් ලෙස දක්වා තිබුණ ද එම ශේෂ හඳුනාගෙන අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) මුදල් රෙගුලාසි 217 ප්‍රකාරව කිසියම් මුදල් වර්ෂයක් තුළදී ගෙවීමට නියමිත මුදල් සියල්ලක්ම හැකිතාක් දුරට එම වර්ෂයේම ගෙවිය යුතුය. එහෙත් නියැදි විගණන පරීක්ෂාවට අනුව අවුරුදු 3 සිට අවුරුදු 5 දක්වා එකතුව රු.98,311,491 ක් හා අවුරුදු 5 ට වැඩි රු.96,452,897 ක් උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා නොතිබුණි. එමෙන්ම උපචිත වියදම් හා අනෙකුත් වෙන් කිරීම් ශේෂය තුළ වසර කිහිපයක සිට පැවත එන රු.55,525,662 ක ශේෂ පැවති බව නිරීක්ෂණය විය.

(ඌ) ඉදිකිරීම් අංශය හා ඉදිකිරීම් උපාංග අංශය විසින් සිදුකරන ලද ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලැබිය යුතු රු.818,462,729 ක් 2015 දෙසැම්බර් 31 දින දක්වා අය වී නොතිබුණි. තව ද විගණනයේදී අනාවරණය කර ගත් තොරතුරු අනුව, මෙම අය විය යුතු වටිනාකම, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.567,601,808 ක් විය.

(එ) උප කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද එකතුව රු.248,519,329 ක් ගෙවීම් කර වසර 05 ක් ඉක්මවා තිබුණ ද ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත. | 2015 වර්ෂයට අදාළ එකතු කළ අගය මත බදු රු.88,165,979 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඡේද අංකය 114 | ප්‍රසාද දීමනා මත ගෙවිය යුතු රු.132,959 ක උපයන විට ගෙවීම් බදු ගෙවා නොතිබුණි. |
| (ඇ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනතේ ඡේද අංක 02 | කාර්තුවකට රු.මිලියන 50 කට වඩා වැඩි ආදායම් උපයන ආයතන විසින් කාර්තුවකට උපරිම රු.මිලියන 30 කට නොවැඩි වනසේ කාර්තු පදනම මත ආදායමෙන් සියයට 0.25 ක ආර්ථික සේවා ගාස්තුවක් ගෙවිය යුතුය. එසේ සංස්ථාව විසින් 2015 වර්ෂයේ උපයන ලද ආදායම වන රු.3,168,016,408 කට අදාළව විගණනයේ ගණනය කිරීම් අනුව ගෙවිය යුතු වූ රු.7,920,041 ක ආර්ථික සේවා ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 396 (ඈ) | 2015 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ක කාලයක් ඉකුත් වූ වටිනාකම රු.1,524,787 ක් වූ චෙක්පත් 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබියදී සේවකයින් 2,492 දෙනෙකු සඳහා රු.8,421,000 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | 2009 ජුලි 01 දිනැති අංක ඩීඑම්ජ්/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයේ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. |
| (උ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඌ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල හා 1980 අංක 46 දරන සේවා නියුක්ති භාර අරමුදල | 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ජීවන වියදම් දීමනාව නොසලකා ගෙවීම් කිරීම හේතුවෙන් එකතුව රු.මිලියන 184.7 ක් හා සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ දායකය පිළිවෙලින් රු.21,336,900 ක් හා රු.5,334,225 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. |
| (එ) | 1979 දෙසැම්බර් 20 දිනැති හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද අංක 121/1979 දරන චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය | ඇණවුම් සමග චෙක්පත් අත්තිකාරම් ලබාදීමෙන් පසු දින 30 ක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද ලබාදෙන ලද එකතුව රු.68,191,290 ක අත්තිකාරම් වසර 3කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------


### 3.1 මූල්‍ය ප්‍රතිඵල


--------------

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.744,581,777 ක ශුද්ධ අලාභයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.74,534,988 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ශුද්ධ ලාභය රු.819,116,765 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.4,235,402,252 කින් අඩු වී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණ ද 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එය අඛණ්ඩව පිරිහී තිබුණි. ඒ අනුව 2011 වර්ෂයේදී රු.206,152,011 ක අතිරික්තය සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.744,581,777 ක ඌනතාවයක් වී තිබුණි. තවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ රු.589,687,734 ක ධන අගයක්ව පැවති දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.218,214,484 ක ඍණ අගයක් බවට පත් වී තිබුණි.

පසුගිය වර්ෂ 04 ක් තුළ සංස්ථාවේ ආදායම, ශුද්ධ වත්කම්, දළ ලාභය හා ශුද්ධ ලාභයෙහි විචලනයන් පහත රූප සටහන් මඟින් ඉදිරිපත් කෙරේ.




**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---------------------------------------

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| **ගිණුම්කරණ අනුපාත** | **2014** | **2015** |
|---|---|---|
| | (සියයට) | (සියයට) |
| දළ ලාභ අනුපාතය | 2.63 | (25.23) |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.63 | (22.37) |
| පිරිවැටුම මත පරිපාලන වියදම | 5.24 | 8.64 |
| පිරිවැටුම මත ශුද්ධ මූල්‍ය වියදම | 0.81 | 1.96 |
| ජංගම අනුපාතය | 1.04 | 0.98 |
| ක්ෂණික අනුපාතය | 0.99 | 0.92 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වසරට සාපේක්ෂව දළ ලාභ අනුපාතය සියයට 1059 කින් හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 3650 කින් පිරිහී තිබුණි.

(ii) ඉකුත් වසරට සාපේක්ෂව පිරිවැටුම මත පරිපාලන වියදම් සියයට 65 කින් හා ශුද්ධ මූල්‍ය වියදම සියයට 142 කින් වැඩි වී තිබුණි.

(iii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය 1.04 සිට 0.98 දක්වා ද ක්ෂණික අනුපාතය 0.99 සිට 0.92 දක්වා ද අඩු වී තිබුණි.

(iv) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මුළු විකුණුම් පිරිවැය ආදායමේ ප්‍රතිශතයක් ලෙස සැළකීමේ දී සියයට 97 සිට සියයට 125 දක්වා වැඩි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක අතර මූල්‍ය ප්‍රතිඵල සැලකීමේදී 2011 වර්ෂයේ සිට සංස්ථාවේ බදු පසු ශුද්ධ ලාභය අඛණ්ඩව අඩු වී තිබූ අතර ඉකුත් වර්ෂය හා සැසදීමේ දී සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 1,098 කින් අඩු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මුළු පිරිවැටුම හා බදු පෙර ශුද්ධ ලාභය පිළිවෙලින් සියයට 57කින් හා සියයට 1,621කින් පිරිහී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායම රු.3,168,016,408 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී එය රු. 4,235,402,252 කින් හෙවත් සියයට 57 කින් පිරිහී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වැටුප්, වේතන දීමනා, කොන්ත්‍රාත් ශ්‍රමය හා ඊට සම්බන්ධ අනෙකුත් වියදම් ලෙස දරා තිබූ මුළු වියදම රු.1,753,310,158 ක් වූ අතර එය මුළු පිරිවැයෙන් සියයට 44 ක් විය.

(ඊ) ඉදිකිරීම් අංශයේ (Construction) ශ්‍රම පිරිවැය මුළු පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස සියයට 46 ක් ද, ඉදිකිරීම් උපාංග අංශයේ (Construction Component) සියයට 35 ක් ද, යාන්ත්‍රික හා විදුලි (M&E) අංශයේ සියයට 51 ක් ද, උපදේශන අංශයේ (Consultancy) සියයට 92 ක් ද, යන්ත්‍රෝපකරණ හා උපාංග (E &M) අංශයේ සියයට 57 ක් ද වී තිබුණි.

(උ) කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා පිරිවැය දැරීම හේතුවෙන් 2015 වර්ෂයේ ව්‍යාපෘති 52 කින් ලැබූ සමුච්චිත අලාභය රු. 803,367,009 ක් බව නිරීක්ෂණය විය.

(ඌ) ඉදිකිරීම් අංශයට අයත් වැඩබිම් 06 ක 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අලාභ ලබා තිබූ අතර මෙම අලාභය 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 61,745,058 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

--------------------

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතෙහි සඳහන් ප්‍රධාන අරමුණු එම පනතේ 3 (2) ඡේදය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් 2008 මාර්තු 28 දිනැති අංක 1543 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් පහත සඳහන් පරිදි සංශෝධනය කර තිබුණි.

(i) ස්වාධීනව හෝ දේශීය හෝ විදේශීය සමාගම් සමග සහසම්බන්ධව දේශීය හා විදේශීය ආයතනයන්ට අයත් සිවිල් ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සහ එවැනි සමාගම් අත්පත් කර ගැනීම සහ කොටස් මිලදී ගැනීම.

(ii) ඉංජිනේරු ක්ෂේත්‍රයේ නියැලි දේශීය හෝ විදේශීය සමාගම් වෙත ස්වාධීනව හෝ කිසියම් දේශීය හෝ විදේශීය සමාගමක් සමග සහසම්බන්ධ වී උපදේශන සේවා සැපයීම හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීමත් එවැනි සමාගම් අත්පත් කර ගැනීම හා කොටස් මිලදී ගැනීම.

(iii) ස්වාධීන ආයතනයක් ලෙස හෝ දේශීය හෝ විදේශීය ආයතනයක් සමග සහ සම්බන්ධව දේපළ සංවර්ධන කටයුතු සිදු කිරීම හෝ එවැනි සමාගම් අත්පත් කර ගැනීම සහ එවැනි සමාගම් වල කොටස් මිලදී ගැනීම.

(iv) දේශීය හෝ විදේශීය වශයෙන් පෙර සූදානම් කළ කොන්ක්‍රීට්, සවි ගැන් වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යාබල කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම.

(v) ඉංජිනේරු ව්‍යාපෘති හෝ ව්‍යාපාරයන් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ආනයනය කිරීම සහ අපනයනය කිරීම.

(vi) ඉහත සඳහන් (i), (ii), (iii), (iv) හා (v) ඡේදයන්හි සඳහන් අරමුණු උදෙසා අවශ්‍ය ඉංජිනේරු සහ වෙනත් ශිල්පීය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

(vii) ඉහත සඳහන් (i), (ii), (iii) හා (iv) ඡේදයන්හි සඳහන් අරමුණු උදෙසා යොදා ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය, ඉදිකිරීම් සහ ශිල්පයන් පිළිබඳ පර්යේෂණ කටයුතු ක්‍රියාවේ යෙදවීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් අංශය

------------------

(i) රත්මලාන ඇලුමිනියම් කර්මාන්ත ශාලාව (වැඩබිම් අංක 6001)

---------------------------------------------------------------------------

ඉදිකිරීම් අංශයට අයත් උක්ත ඇලුමිනියම් කර්මාන්ත ශාලාවේ ආදායම 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 62 කින් අඩුවී තිබූ අතර පසුගිය වර්ෂයේ රු.මිලියන 1.79 ක් වූ මෙහෙයුම් අලාභය රු.මිලියන 4.18 ක අලාභයක් දක්වා සියයට 133 කින් පිරිහී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව උපකොන්ත්‍රාත් ශ්‍රම වියදම අසාමාන්‍ය ලෙස වැඩිවීම මෙම තත්ත්වය කෙරෙහි සෘජුව බලපා තිබුණි.

(ii) මාලිගාවත්ත යන්ත්‍ර කුලියට දීමේ වැඩබිම (වැඩබිම් අංක 828)

------------------------------------------------------------------------

මාලිගාවත්ත යන්ත්‍ර කුලියට දීමේ වැඩබිමෙහි පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 84 කින් පිරිහී තිබූ අතර පසුගිය වර්ෂයේ රු.මිලියන 0.22 ක් වූ මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4.95 ක් දක්වා පිරිහී තිබුණි.

(ආ) ඉදිකිරීම් උපාංග අංශය

----------------------------

(i) පෙරසවි වැඩබිම - රත්මලාන (වැඩබිම් අංක 343)

------------------------------------------------------------

මෙම වැඩබිමෙහි පසුගිය වර්ෂයේ රු.මිලියන 3.51 ක් වූ මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 33.67 ක මෙහෙයුම් අලාභයක් බවට පත්වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 49 කින් පිරිහීමත්, විකුණුම් පිරිවැය නොවන වියදම් සියයට 12 කින් වැඩිවීමත් මෙම තත්ත්වයට බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ii) දංකොටුව ගඩොල් හා වඩු නිෂ්පාදන අංශය (වැඩබිම් අංක 1099)

---------------------------------------------------------------------------

පසුගිය වර්ෂ 18 අතරින් වර්ෂ 17 ක්ම අලාභ ලබා ඇති මෙම වැඩබිමේ පසුගිය වර්ෂයේදී රු.මිලියන 4.3 ක් වූ මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂයේදී සියයට 92 කින් පිරිහී රු.මිලියන 8.25 ක අලාභයක් බවට පත්වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 38 කින් පිරිහී තිබුණද, විකුණුම් පිරිවැය නොවන අනෙකුත් වියදම් සියයට 68 කින් වැඩි වී තිබුණි.

(iii) පෙරසවි වැඩබිම - පැලියගොඩ (වැඩබිම් අංක 1168)

සී සිටි ව්‍යාපෘතිය ඉදිකිරීමේදී බිම සකස් කිරීම නිසි කළමනාකරණයකින් සිදු නොකිරීම නිසා මෙම වැඩබිමෙහි තිබූ රු.12,397,200 ක් වටිනා පෙරසවි නිෂ්පාදන විනාශ වී ඇති බවත් ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 12.4 ක අලාභයක් ලබා තිබූ බවත් අනාවරණය විය.

(iv) පෙරසවි වැඩබිම - වැලිකන්ද (වැඩබිම් අංක 1738)

පසුගිය වර්ෂයේ රු.මිලියනයක මෙහෙයුම් ලාභයක් ලබා තිබූ මෙම වැඩබිමෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1.37 ක අලාභයක් ලැබී තිබුණි. විකුණුම් පිරිවැය හා අනෙකුත් වියදම් වැඩිවීම මෙම තත්ත්වයට බලපා ඇති බව අනාවරණය විය.

(v) කොන්ක්‍රීට් සිල්පර වැඩබිම (වැඩබිම් අංක 1510)

පසුගිය වර්ෂයේ රු.මිලියන 43.27 ක මෙහෙයුම් ලාභයක් ලබා තිබූ මෙම වැඩබිමේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.මිලියන 25.42 දක්වා පිරිහී තිබුණි. වැඩබිමේ ආදායම සියයට 22 කින් අඩුවීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශය

(i) පැලියගොඩ මෙහෙයුම් වැඩබිම (වැඩබිම් අංක 102)

උක්ත වැඩබිමෙහි 2013 වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.මිලියන 1.65 ක් ද 2014 වර්ෂයේදී එය රු.මිලියන 3.86 ක් ද, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.5 ක් ද වශයෙන් එය දිගින් දිගටම පිරිහී තිබුණ බව නිරීක්ෂණය විය. විකුණුම් ආදායම අඛණ්ඩව සීඝ්‍රයෙන් අඩුවීම මෙම තත්ත්වය කෙරෙහි සෘජුව බලපා තිබුණි.

(ii) පැලියගොඩ මෙහෙයුම් වැඩබිම (වැඩබිම් අංක 104)

2013 වර්ෂයේ රු.මිලියන 7.43 ක මෙහෙයුම් ලාභයක් ලැබූ මෙම වැඩබිම 2014 වර්ෂයේදී රු.මිලියන 1.33 ක අලාභයක් ද සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 35.14 ක අලාභයක් දක්වා ද පිරිහී තිබුණි. විකුණුම් ආදායම සීඝ්‍ර ලෙස අඩුවීමත්, විකුණුම් පිරිවැය ඉහළ යාමත් මෙම තත්ත්වය කෙරෙහි බලපා තිබුණි.

(iii) මාතලේ ඩොලමයිට් වැඩබිම (වැඩබිම් අංක 1100)

ඉහත වැඩබිමෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳ සමාලෝචනයේදී පසුගිය වර්ෂ 17 අතුරින් 2006 වර්ෂය හැරුණු විට අනෙක් සියලුම වර්ෂයන්හි අලාභ සහිතව පවත්වා ගෙන ගොස් තිබුණි. 2014 වර්ෂයේදී රු.මිලියන 4.29 ක් වූ මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10.23 ක අලාභයක් දක්වා සියයට 139 කින් පිරිහී තිබූ අතර විකුණුම් ආදායම සීඝ්‍ර ලෙස අඩු වීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(iv) රත්මලාන වැඩපල (වැඩබිම් අංක 888)

මෙම වැඩපල සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.95 ක මෙහෙයුම් අලාභයක් ලබා තිබූ අතර පසුගිය වර්ෂයේ රු.මිලියන 30.82 ක් වූ ආදායම රු.මිලියන 5.75 දක්වා අඩුවීමත්, විකුණුම් පිරිවැය හා අනෙකුත් වියදම් වැඩිවීමත් මෙම තත්ත්වය කෙරෙහි බලපා තිබුණි.

(ඇ) විශේෂ මෙහෙයුම් අංශය

----------------------------

ගලපාත ඇස්පෝල්ට් වැඩබිම (වැඩබිම් අංක 1843)

------------------------------------------------------------

මෙම වැඩබිමේ 2013 අගෝස්තු 01 දින නිෂ්පාදනය ආරම්භ කර, 2015 දෙසැම්බර් 31 දිනෙන් පසුව නිෂ්පාදන කටයුතු නවතා තිබූ අතර නිෂ්පාදන කටයුතු වැඩ කරන දින 64 කට පමණක් සීමා වී තිබුණි. නිෂ්පාදන කටයුතු නවතා තිබුණ ද වැඩබිමට අනුයුක්ත කර තිබූ සේවකයින් තවදුරටත් එම වැඩබිමෙහි රඳවාගෙන වැටුප් ගෙවීම හේතුවෙන් පසුගිය වර්ෂයේ රු.මිලියන 3.7 ක් වූ අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 15.53 ක අලාභයක් දක්වා වැඩි වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 24.03 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණි.

(ඉ) යන්ත්‍රෝපකරණ අංශය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) යන්ත්‍රෝපකරණ අංශයේ කොලොන්නාව ප්‍රධාන ගබඩාව ඇතුළුව ප්‍රාදේශීය කාර්යාල හා වැඩබිම් 23 කින් කිසිදු වැඩබිමක් සමාලෝචිත වර්ෂයේදී ලාභ ලබා නොතිබූ අතර වර්ෂය අවසානයට ලබා තිබූ සමුච්චිත අලාභය රු.මිලියන 177.73 ක් වී තිබුණි.

(ii) වව්නියාව, කුරුණෑගල, කුලියාපිටිය, ආනමඩුව යන ප්‍රාදේශීය කාර්යාල පසුගිය වර්ෂයේ ලබා තිබූ රු.මිලියන 14.04 ක සමුච්චිත ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.88 ක අලාභයක් දක්වා අඩු වී තිබුණි.

(iii) කොලොන්නාව ප්‍රධාන ගබඩාව, හොරණ, කුණ්ඩසාලේ, අම්පාර, කල්මුණේ, තමන්කඩුව යන ප්‍රාදේශීය කාර්යාල හා කෑගල්ල ඩිපෝව යන වැඩබිම් පසුගිය වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදී කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර, වැටුප්, වේතන, විදුලිය, දුරකථන, ඉන්ධන හා අනෙකුත් වියදම් වශයෙන් රු.මිලියන 26.84 ක වියදමක් සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණි.

(iv) ඉදිකිරීම්, යාන්ත්‍රික හා විදුලි සහ යන්ත්‍රෝපකරණ (M&E) අංශවලට අයත් වැඩබිම් 03 ක් සඳහා රු.1,065,550 ක පිරිවැයක් දරා ඇතත් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

කාල පරිච්ඡේදය අවසානයේදී සංස්ථාව සඳහා බැංකු අයිරා සීමාව රු. මිලියන 353.7 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එම අයිරා සීමාව ඉක්මවා රු. මිලියන 78 ක අයිරා ලබාගෙන තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු ලියාපදිංචිය අක්‍රිය කරන ලද සැපයුම්කරුවන් 09 දෙනෙකු වෙත එකතු කළ අගය මත බදු ලෙස 2014 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.608,474 ක් හා රු.182,950 ක් ගෙවා තිබුණි.

(ආ) 2002 අංක 14 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු පනතේ 1 වන උපලේඛනයේ II කොටසේ (a) (VI) හා (XVIII) අනුව ඩීසල් සහ ගල්කීල් බද්දෙන් නිදහස් කර තිබුණද සැපයුම්කරුවන්ගේ ඉන්වොයිස් සඳහා එකතුකළ අගය මත බදු ලෙස රු.4,752,280 ක් ගෙවා තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

---

**(අ) ඇල්පිටිය ඇස්පෝල්ට් නිෂ්පාදන වැඩබිම ස්ථාපිත කිරීම සඳහා කල්බදු පදනම මත ඉඩමක් ලබා ගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ශක්‍යතා අධ්‍යයනයක් කිරීමකින් තොරව හා මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ලබානොගෙන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 780/53 මගින් මාසිකව රු.50,000 ක් බැගින් වසර 05 ක කාලපරිච්ඡේදයක් සඳහා 2012 සැප්තැම්බර් 07 දින රු.3,000,000 ක බදු මුදල් එකවර ගෙවා තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේදීම නවතා දමා තිබුණි.

(ii) ඉඩම් අයිතිකරු විසින් ඉඩමේ කළුගල් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා 2012 පෙබරවාරි සිට වසරක කාලයක් සඳහා ලිඛිත අවසරයක් ලබාගෙන තිබුණි. 2012 වර්ෂයේදී CATIC (Chin National Aero Technology Import & Export Corporation) ආයතනය මගින් මෙම භූමිය ඇස්පෝල්ට් නිෂ්පාදනයට සුදුසු නොවන බව දන්වා තිබුණ ද ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාළ අනෙකුත් වියදම් ලෙස රු.1,515,524 ක් දරා තිබුණි.

**(ආ) ගලපාත ඇස්පෝල්ට් හා ක්‍රෂර් යන්ත්‍ර වැඩබිම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අමුද්‍රව්‍ය සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලබා දී තිබූ අතර එකතුව රු.29,642,269 ක් සඳහා අමුද්‍රව්‍ය සපයා නොතිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා 2016 දෙසැම්බර් 25 දක්වා වසර 02 ක් සඳහා රු.1,800,000 ක කුලී මුදලක් ගෙවා තිබුණද, දින 03 ක් පමණක් නිෂ්පාදන කටයුතු සිදුකර ඇස්පෝල්ට් ටොන් 279.36 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහි සමුච්චිත අලාභය රු.25,580,485 ක් වී තිබුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්‍රාමික පාරිතෝෂික දීමනා නියමිත දිනට නොගෙවීම හේතුවෙන් සේවකයින් තිදෙනෙකුට රු.255,567 ක අධිභාරයක් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ මාර්ග ඉදිකිරීම් සඳහා 2011 වර්ෂයේ දී කොන්ත්‍රාත් 52 ක් ලබාදී තිබූ අතර කොන්ත්‍රාත් 26 ක් සඳහා කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා රු. 53,198,183 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘති තුළින් ව්‍යාපාති 5ක් ආරම්භක අවස්ථාවේදීම නවතා දමා තිබූ අතර ඒ සඳහා ගෙවා තිබූ රු.36,385,693 ක සචලිකරණ අත්තිකාරම් (Mobilization Advance) අය කරගැනීමට ද කටයුතු කර නොතිබුණි.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9. ඡේදයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථාවේ සේවකයන් 29 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර එම සේවකයන්ගේ වැටුප් ලෙස 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා රු. 31,638,155 ක්ද, 2016 ජනවාරි සිට මැයි මාසය දක්වා රු.4,804,200 ක් ද වශයෙන් එකතුව රු.36,442,355 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

(ආ) අනියම් සේවකයින් දෙදෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර 2016 ජනවාරි 01 සිට 2016 ඔක්තෝබර් 31 දක්වා රු.698,580 ක වැටුප් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) දෛනික වැටුප් මත බඳවාගත් අනියම් හා නුපුහුණු සේවකයන් 05 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර එම සේවකයන්ට ගෙවිය යුතු වැටුප් ගණනය කිරීමෙන් තොරව, 2016 ජනවාරි 01 සිට 2016 ජූනි 30 දක්වා වැටුප් අත්තිකාරම් ලෙස රු.500,000 ක් ගෙවා තිබුණි.

## 4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) **නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති පරීක්ෂාව - කාලිංග මාවත**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අංක 12/1165/503/083 දරන ලිපිය පරිදි නිවාස ඒකක 816 ක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම කොන්ත්‍රාත්තුව සංස්ථාවට ප්‍රදානය කර තිබූ නමුත් පසුව නිවාස ඒකක 648 ක් පමණක් ඉදිකිරීමට දෙපාර්ශවය එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය අදියර 02 කින් ක්‍රියාත්මක කිරීමට සහ පළමු අදියර 2015 දෙසැම්බර් 19 වන දින අවසන් කිරීමට අපේක්ෂා කළද, 2015 ජූනි 04 දිනෙන් පසු වැඩ නවතා දමා තිබුණි.

(ආ) අදියර 02 යටතේ වූ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2014 අප්‍රේල් 21 දින ආරම්භ කර තිබූ අතර එය 2016 ඔක්තෝබර් 21 දින අවසන් කිරීමට අපේක්ෂා කළ ද 2015 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ වැඩ නවතා දමා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) වගන්තියට පටහැනිව උප කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ඉක්මවා රු.4,803,492 ක සවලීකරණ අත්තිකාරම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 83.5 ක් වන උප කොන්ත්‍රාත් දෙකක කොන්ත්‍රාත් කාලය 2015 මාර්තු 19 වන දිනෙන් අවසන් වී තිබුණද එහි භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. මෙම කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබූ සවලීකරණ අත්තිකාරම් වටිනාකම රු. මිලියන 3.9 ක් අයකරගෙන නොතිබූ අතර කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ රු. මිලියන 4.2 ක් වූ අත්තිකාරම් බැඳුම්කරයන්හි වලංගු කාලය ඉකුත් වී තිබුණ ද එය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ අයහපත් මූල්‍ය පාලනය හා උප කොන්ත්‍රාත්කරුවන්ට නියමිත පරිදි ගෙවීම් නොකිරීම හේතුවෙන් ඉදිකිරීම් භෞතික ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවති, කොන්ත්‍රාත් වටිනාකම රු.1,704,907,440 ක් වූ කාලිංග මාවතේ ඉදිකරමින් තිබූ නිවාස ව්‍යාපෘති දෙක නාගරික සංවර්ධන අධිකාරිය විසින් නැවත පවරා ගැනීමට කටයුතු කර තිබුණි.

(ඊ) 2010 වර්ෂයේ දී සේවාදායකයන්ගෙන් එකතුව රු.27,596,156 ක් වූ සවලීකරණ අත්තිකාරම් ලබාගෙන තිබූ අතර, මේ දක්වා ඒ සඳහා කිසිදු සේවාවක් ඉටුකර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය හා සැසඳීමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 21 කට අදාළව නිලධාරීන් 65 ක් හා තෘතීය කළමනාකරණ මට්ටමේ තනතුරු 39 කට අදාළව නිලධාරීන් 139 ක් ද ඇතුළුව සමස්ත කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 101 කට අදාළව සේවකයින් 559 ක් 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ බොහොමයක් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2009 හා 2011 වර්ෂවලදී සංස්ථාවට ලැබී තිබුණද, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 6 ක් සඳහා නිලධාරීන් 6 දෙනෙකු ඉහළ වැටුප් තලයන් යටතේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය අනුව පත්කිරීමක් කළ හැක්කේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරකට පමණි. එහෙත් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 41 ක් සඳහා අතිරික්ත සේවකයන් 451 දෙනෙකු 2015 දෙසැම්බර් 31 දිනට බඳවා ගෙන තිබුණි.

(ඈ) 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නව තනතුරු ඇතිකිරීම හෝ පුරප්පාඩු පිරවීම සිදු නොකළ යුතු බව දන්වා තිබුණි. එහෙත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැති ඉහත සඳහන් අතිරික්ත සේවකයන් 451 දෙනා අතුරින් අනුමත නොවන තනතුරු 13 ක් සඳහා සේවකයන් 16 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ඉන් තනතුරු 7 ක් සඳහා බඳවා ගත් සේවකයන්ගේ පත්වීම් ස්ථිර කර තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට නුපුහුණු සේවකයන් 99 ක් අතිරික්තව සිටියදී 2016 ජනවාරි 01 සිට 2016 ඔක්තෝබර් 31 දක්වා කාලය තුළ අනියම් හා නුපුහුණු සේවකයන් 300 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව දෛනික වැටුප් පදනම මත බඳවා ගෙන රු.74,107,520 ක් වැටුප් ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අසාධාරණයට ලක්වූ සේවකයන්ට සහන සැලසීම සඳහා සභාපති විසින් කමිටුවක් පත් කර තිබූ අතර එහි සාමාජිකයන් තිදෙනාගෙන් දෙදෙනෙකුම සංස්ථාවේ සේවයේ නියුතු නිලධාරීන් (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන සහ නීති නිළධාරි) වූ හෙයින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ගේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබඳව විගණනයට සෑහීමකට පත් විය නොහැකි විය.

තවද එම කමිටුව විසින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවන පරිදි කරන ලද නිර්දේශයන් පහත දැක්වේ.

(i) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.10 වගන්තිය ප්‍රකාරව පත්වීම් බලධරයෙකු විසින් මොනයම් හේතුවක් නිසා හෝ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය රහිතව පත්වීමක් පෙර දාතම් නොකළ යුතු වුවද, ඊට පටහැනිව කළමනාකාර සහකාර, පරිපාලන නිලධාරී හා ගණකාධිකාරී යන තනතුරු සඳහා පත්කළ නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් පිළිවෙලින් වර්ෂ 07, වර්ෂ 06 සහ වර්ෂ 2 මාස 06 කින් පෙරදාතම් කර පත්වීම් ලබාදී තිබුණි.

තවද, මෙම නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව පෙර දාතම් කළ දින සිට බලපැවැත්වෙන පරිදි නව තනතුරුවලට අදාළව හිඟ වැටුප් හා සේවය අත්හිටවා ඇති වර්ෂයකට අධික කාලයක් සඳහා වැටුප් වශයෙන් රු.948,175 ක් ගෙවා තිබුණි.

(ii) තවද, ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.11 හා 1.11.1 ඡේද ප්‍රකාරව පත්වීමක් පෙර දාතම් කිරීමක් හේතුවෙන් එම තනතුරට හෝ ශ්‍රේණියට ඔහුට පෙර පත් කළ නිලධාරියකුට වැඩි ජ්‍යෙෂ්ඨත්වයක් හිමි වන්නේ නම් පෙරදාතම් කිරීමක් නොකළ යුතු බව සඳහන් වුවද, පරිපාලන නිලධාරී පත්වීම පෙරදාතම් කිරීම හේතුවෙන් උක්ත වගන්තිවල විධි විධිවිධානයන්ට පටහැනිව සංස්ථාව ක්‍රියා කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.10, 1.10.2, 1.11, 1.11.1 ඡේදයන් කෙරෙහි අවධානය යොමු නොකර එම ඡේදයන්හි සඳහන් විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි විමර්ශන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශයන් ඉදිරිපත්කර ඇති බව ඉහත නිරීක්ෂණ අනුව අනාවරණය විය.

(උ) සංස්ථාවේ වැඩබැලීම් පත්වීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තුළ ඉහළ හා මධ්‍යම කළමනාකරණ මට්ටමට අයත් තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කිරීමකින් තොරව නිලධාරීන් 12 දෙනෙකු 2015 වර්ෂය තුළ වැඩබලන තනතුරුවලට පත්කර තිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩබලන තනතුරු සඳහා නිත්‍ය පත්වීම් නොපමාව ලබාදීම ආයතනයේ වගකීම වන අතර උක්ත නිලධාරීන් අතුරින් බොහොමයක් වර්ෂ 01 සිට වර්ෂ 11 දක්වා වූ කාල පරාසයන් තුළ වැඩබලන තනතුරුවල රාජකාරී ඉටුකරන බවත්, එම තනතුරු සඳහා නිත්‍ය පත්වීම් ලබාදීමට විගණිත දිනය වූ 2016 අගෝස්තු මස 12 දින වන විටත් සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(iii) සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙකු ලෙස නිත්‍ය තනතුරක් දරන නිලධාරියෙකු ඉදිකිරීම් උපාංග අංශයේ වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ වැඩබලන කළමනාකාර යනාදී වශයෙන් තනතුරු තුනක රාජකාරී කිරීම සඳහා යෙදවීමෙන් එම නිලධාරියා සතුව පවතින වැඩ කිරීමේ ධාරිතාවය පිළිබඳව සංස්ථාවේ කළමනාකාරීත්වය අවධානය යොමු කොට නොතිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.6 ඡේදය ප්‍රකාරව වැඩබැලීමේ වැටුප් ගෙවීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, සංස්ථාවේ වැඩබැලීමේ වැටුප් ගෙවීම සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1. ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්තාව හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම දින 436 ක කාල ප්‍රමාදයකින් පසුව 2017 මැයි 17 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

-------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එය සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කර නොතිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 46 සිට සියයට 70 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

### 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් 2014 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2017 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

### 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් පැලියගොඩ පිහිටි ඉඩමෙන් අක්කර 2.5 ක වපසරියකින් යුතු භූමි ප්‍රමාණයක ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් රු. මිලියන 36 වැයකර තාක්ෂණික සේවා උද්‍යානයක් හා අඩු වියදම් නිවාස ආකෘති කිහිපයක් ඉදිකොට තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු සංස්ථාව විසින් සිදුකර ඇති අතර ඒ වෙනුවෙන් සංස්ථාවට රු. මිලියන 2.2 ක් ලැබිය යුතුව තිබුණි. එනමුත් වැඩබිමෙහි ආරක්ෂක සේවාව වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2015 දක්වා රු. මිලියන 1.2 ක මුදලක් වැයකර තිබුණද එය ඵලදායී කටයුත්තකට භාවිතා කර නොතිබුණි.

(ආ) පැලියගොඩ-සී සිටි ව්‍යාපෘතිය 2013 ජූලි 06 දින ආරම්භකර 2014 ජනවාරි 31 දින අවසන් කිරීමට අපේක්ෂා කළද, 2015 සැප්තැම්බර් 03 දින වන විටත් ව්‍යාපෘති කටයුතු අවසන් නොකොට නවතා දමා තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් වැයකළ මුදල රු. මිලියන 463ක් වූ අතර ප්‍රමාණ පත්‍රයේ සඳහන් වැඩ විෂයන් 18 කින් වැඩ විෂයන් 12 කට අදාළ ඉදිකිරීම් කාර්යයන්හි කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| | (ii) ගෙවිය යුතු බදු හා ඒ සඳහා අධිභාර ගිණුම්ගත කර නොතිබීම. |
| | (iii) පාලන ගිණුම් සසඳා නොතිබීම. |
| | (iv) නියමිත දිනයන්ට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම. |
| (ආ) මූල්‍ය පාලනය | (i) ඇණවුම් සමග චෙක්පත් මගින් අත්තිකාරම් ලබාදීම. |
| | (ii) දීර්ඝ කාලයක සිට පැවත එන ණයගැතියන්ගෙන් මුදල් අයනොවී පැවතීම, හා ණයගැති පාලනය දුර්වල තත්ත්වයක පැවතීම. |
| | (iii) අදාළ සේවා දායකයන් සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කිරීම පිළිබඳ සැලකිය යුතු ප්‍රමාදයන් පැවතීම. |
| | (iv) ගැනුම් අත්තිකාරම් නිරවුල් නොකර දීර්ඝ කාලයක සිට පැවතීම. |
| | (v) දිගුකාලීන ඉදිකිරීම් රඳවා ගැනීම් මුදල් නිරවුල් නොකිරීම. |
| (ඇ) වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | (i) වැඩ පූර්ව අත්තිකාරම් නිරවුල් නොකර දීර්ඝ කාලීනව පැවතීම. |
| | (ii) බදු නියමිත දිනට නොගෙවීම නිසා අධිභාර ගෙවීමට සිදුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | (i) | මානව සම්පත් වෙනත් ආයතනවලට මුදා හැරීම. |
| | | (ii) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයන් බඳවා ගැනීම. |
| | | (iii) | කොන්ත්‍රාත් පදනම මත ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සඳහා නිලධාරීන් බඳවා ගැනීම. |
| (ඉ) | වත්කම් කළමනාකරණය | (i) | නිෂ්ක්‍රීය වත්කම් විධිමත් පරිදි උපයෝජනය කිරීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | ඉඩම් අයිතිය පවරා නොගැනීම. |
| (ඊ) | තොග පාලනය | | සියලුම වැඩබිම්වල වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබීම. |